# ග්‍රෙනේඩ හා සංකේත

ෂාරුක් ඛාන්ගේ සංගීත සන්දර්ශනයට බෝම්බයක් (ග්‍රෙනේඩයක්) දමා ගැසුවේ හෝ තබා ගියේ කවු ද යන්න ඇතැම්විට මතුදිනයක පොලීසිය විසින් සොයාගනු ලබනු ඇත. එය කවරුන් කළත් හුදු දේශපාලනික ක්‍රියාවක් බව පැහැදිලි ය. මෙහි දී හුදු දේශපාලනික යනුවෙන් සඳහන් කරන්නේ ඇතැම් විට විරුද්ධ සංගීත කණ්ඩායම් ද ග්‍රෙනේඩ පිපිරවීමට ඉඩ ඇති බැවින් ය. එවැනි ක්‍රියාවල ද යම් දේශපාලනයක් ඇති නමුත් මේ එවැන්නක් නම් නොවන බව පැහැදිලි ය. මෙවැනි දේශපාලනික ග්‍රෙනේඩ පිපිරවීමකින් බලාපොරොත්තුවන්නේ කුමක් ද? ඒ එක්කෝ තම දේශපාලන පක්‍ෂයට හෝ සංවිධානයට හෝ දේශපාලන වාසියක් ලබාගැනීම විය හැකි ය. නැතහොත් ආණ්ඩුව අපකීර්තියට ලක්කිරීම විය හැකි ය. එසේත් නැත්නම් ඒ දෙකම විය හැකි ය. ඒ අතර තවත් කරුණු ද නැත්තේ නො වෙයි.

මේ පිපිරවීම ආණ්ඩුවට සම්බන්ධ දේශපාලන පක්‍ෂයකින් නො කෙරුණු බව ද පැහැදිලි ය. දේශපාලන පක්‍ෂ හෝ කණ්ඩායම් ලෙස ගත්කල පිපිරවීම කරන්නට ඇත්තේ විරුද්ධ පක්‍ෂ කණ්ඩායමක් වීමට ඉඩක් ඇත. එලෙස ම වෙනත් සංවිධාන ද මේ රටේ ක්‍රියාත්මක වෙයි. රාජ්‍ය නොවන සංවිධාන, ආගමික සංවිධාන ආදී වශයෙන් දේශපාලන වැදගත්කමක් ඇති සංවිධාන රාශියක් වෙයි. කිනම් සංවිධානයක් ග්‍රෙනේඩ පිපිරවීම පිටුපස සිටිය හැකි ද? ග්‍රෙනේඩය පුපුරවා ඇත්තේ කිනම් අරමුණකින් ද? එය සංගීත සන්දර්ශනය කඩාකප්පල්කිරීමට නම් නොවන බව පැහැදිලි ය. ග්‍රෙනේඩය ගෙන ආ තැනැත්තා, තැනැත්තිය හෝ පිරිස සංගීත ලෝලීන් යැයි කිව හැකි ය. සංගීත සන්දර්ශනය කඩාකප්පල්කිරීමට පැමිණි අයකු එසේ කිරීමට සන්දර්ශනයේ අවසාන මිනිත්තු කිහිපය තෙක් බලා සිටින්නේ නැත. සන්දර්ශනය කඩාකප්පල් නොකරම ග්‍රෙනේඩය පුපුරවා හැර ඇත. එමෙන් ම ග්‍රෙනේඩය තැන්පත්කිරීමෙන් පසුව ඒ ගෙනා අය පිටවී ගොස් ඇති බව ද පැහැදිලි ය.

ග්‍රෙනේඩය පිපිරීමෙන් මියගිය අයගේ පවුල්වලට දැනෙන කිසිදා මැකිය නොහැකි පාඩුව සංවේගය ආදිය හැරුණුකොට ඒ පිපිරීමෙන් වඩාත්ම පාඩුව සිද්ධ වී ඇත්තේ මෙරට සිංහල බෞද්ධයනට ය. විශේෂයෙන් ම සිංහල භික්‍ෂූන් වහන්සේට ය. සිංහල බෞද්ධයනට පහර දීමට දත මැදගෙන සිටින බීබීසිය ( බීබීසියේ අගුපිලේ වැතිරෙන කසිකබල් සන්දේශය අප තුට්ටු දෙකකට සැලකිය යුතු නො වෙයි.) ප්‍රධාන බටහිර ජනමාධ්‍යවලට තළු ගසමින් වමාරමින් අනුභව කළහැකි ආහාරයක් ලැබී ඇත. සිංහල බෞද්ධයන්ගේ ම්ලේච්ඡ ක්‍රියා ගැන දැන් නැවතත් පලිප්පු දමමින් කතාකළ හැකි ය. ග්‍රෙනේඩය පිපිරවීමෙන් ලෝ පුරා ජනමාධ්‍ය විසින් සකස් කෙරෙන ජනමතය ඔස්සේ අපහාසයට, පරිභවයට, දෝෂාරෝපනයට ආදී සියල්ලට භාජනයවන්නේ සිංහල බෞද්ධයන් ය. එහෙත් ඉන් කියැවෙන්නේ සිංහල බෞද්ධ සංවිධානයක් හෝ පක්‍ෂයක් හෝ ග්‍රෙනේඩ පිපිරවීමට සම්බන්ධ නැති බව නො වෙයි. එවැනි සංවිධානයක් විසින් කරන ලද්දක් පාරාවලල්ලක් වීමට ඉඩක් තිබම ද එයට හේතුව වෙයි.

එහෙත් සිංහල බෞද්ධයන් වෙනුවෙන් අව්‍යාජව පෙනී සිටින සංවිධානයක් එවැනි පිපිරවීමක් කරන්නට ඇතැයි සිතිය නො හැකි ය. එවැනි සංවිධානයකට එවැනි සිද්ධියක් පාරාවලල්ලක් වීමට ඇති ඉඩකඩ තේරෙයි. මේ පිපිරවීම සිංහල බෞද්ධයන්ට පහර දීමට සූදානමින් සිටින පක්‍ෂයක් හෝ සංවිධානයක් හෝ එවැනි සංවිධාන කිහිපයක් හෝ විසින් කෙරිණි යැයි සිතිය හැකි ය. පිපිරවීමට ජාතික හෙළ උරුමය සම්බන්ධ යැයි කිව නො හැකිය. එහෙත් ග්‍රෙනේඩ පිපිරවූ අයට ඉනිමං බැන්දේ නම් ජාතික හෙළ උරුමයේ ක්‍රියා පටිපාටිය ය යන්න අසාධාරණ ප්‍රකාශයක් නො වෙයි. ජාතික හෙළ උරුමය යනුවෙන් අද ඇඟිල්ල දික්කර පෙන්විය හැකි නිශ්චිත කණ්ඩායමක් නැත. ඒ කොටස් කිහිපයකට කැඩී ඇත. මෙහි දී මා සඳහන්කරන්නේ කලක් ජනතා මිතුරන් ලෙස ක්‍රියාත්මක වූ, ජාතිකත්වය ගසාකන කණ්ඩයමේ නායකත්වය යටතේ ක්‍රියාත්මකවන කොටස ගැන ය. මොවුන්ගෙන් ජාතික ව්‍යාපාරයට වී ඇති හානිය ඉමහත් ය. ඔවුන් ග්‍රෙනේඩ පිපිරවීමට හවුල් නැති වුව ද ඒ සිද්ධියට ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය හේතුවීම නිසා නැවතත් වරක් ඔවුන්ගෙන් සිංහල බෞද්ධයනට වක්‍රව හෝ පහරක් එල්ල වී ඇත.

මේ කණ්ඩායමෙහි ඇතැම් නායකයෝ එළියට නො පැමිණෙති. සිංහල බෞද්ධ විරෝධී රාජ්‍ය නොවන සංවිධානවලට සම්බන්ධ පුද්ගලයෙක් මෙහි න්‍යායාත්මක දේශපාලනයක යෙදෙයි. නායකත්ව ත්‍රිත්වයෙහි එක් අයකු ලෙස මොහු හැඳින්විය හැකි ය. කෙසේ හෝ වේවා ඔවුන් විසින් නායකත්වය දෙනු ලබන ජාතික හෙළ උරුම කොටස ෂාරුක්

© Prof. Nalin De Silva

බාන්ගේ සන්දර්ශනයට එරෙහිව උපවාස කරන බව රටට හැඟවූහ. අවසානයේ දී ඔවුන් උපවාසයට ශාරීරිකව සම්බන්ධ නොවුනා විය හැකි ය. එය සෝම හිමි ගුණ සැමරුම සඳහා පිහිටුවා ගෙන ඇති වෙනත් භික්ෂු සංවිධානයක් විසින් සිදු කෙරුණු ලැබුවා විය හැකි ය. එහෙත් සුළු පිරිසක් හෝ උපවාස මානසිකත්වයට තල්ලු කරනු ලැබුයේ ඉහත කී කණ්ඩයම විසින් ය. මේ මානසිකත්වය තව තවත් වර්ධනයකිරීමට සිංහල බෞද්ධ සංස්කෘතිය නැසීම සඳහා ම පිහිටුවා ඇති එක්තරා ඉලෙක්ට්‍රොනික ජනමාධ්‍යයක් කටයුතු කෙළේ ය. ඒ අපට පෙනෙන්නට ඇති කරුණු ය. ඒ අතර සිංහල බෞද්ධයකු නොවන එහෙත් සිංහල බෞද්ධ සංවිධානවල ක්‍රියාත්මකවන, දියවන්නා ඔය අසල වෙසෙන ඒ ජා ප මණ්ත්‍රීවරයකු ගැන ද කියැවෙන බව සඳහන්කළ යුතු ය. 1962 සිරිමා බණ්ඩාරනායක ආණ්ඩුවට විරුද්ධ ව ක්‍රියාත්මක වූ කුමන්ත්‍රණයේ නායකයකුගෙන් පැවත එන මොහුගෙන් ඊනියා සිංහල බෞද්ධ පක්ෂ හා සංවිධාන මූල්‍ය ආධාර ලබාගන්නා බව රහසක් නො වෙයි.

ෂාරුක් ඛාන් දෙසැම්බරයේ ලංකාවට එන බව සඳහන් කර මාස ගණනාවක් ගෙවී ගොස් ඇත. එහෙත් ජාතික හෙළ උරුමයේ ඉහත සඳහන් කොටස ඒ ප්‍රකාශකළ දිනවල කිසිම විරුද්ධත්වයක් නො දැක්වූහ. සන්දර්ශනය පැවැත්වෙන්නේ සෝම හිමියන්ගේ අපවත්වීමේ වර්ෂ පූර්ණ දිනයට පෙර දින බව ඔවුන්ට එදා අමතක වන්නට ඇත. ඔවුන්ට ඒ බව මතක්වූයේ සෙසු සංවිධාන ඒ නිමිත්තෙන් විවිධ පින්කම් රැස්වීම් සංවිධානය කිරීමට පටන්ගැනීමෙන් පසුව ය. ඉහත කී කණ්ඩයම තමන් සෝම හිමියන්ගේ ධජය අතට ගත් බවක් රටට කීමට තැත්කළ ද ඒ නිමිත්තෙන් ඔවුන් සංවිධානය කළ පින්කමක් නැත. ඔවුන් කළ එකම දෙය වූයේ ෂාරුක් සන්දර්ශනයට සමාන්තරව උපවාස සන්දර්ශනයක් ගැන කතාකිරීම ය. මොවුහු ව්‍යාජ සන්දරශනකරුවෝ වෙති.

මේ සිද්ධියෙන් මෙරට සාධාරණ වශයෙන් ගත්කල සිංහල බෞද්ධ දේශපාලනයහි ස්වරූපය ඉස්මතු වී පෙනෙයි. අනගාරික ධර්මපාලතුමා හා එල්. එච් මෙත්තානන්ද මහතා වැනි කිහිප දෙනකුට හැරෙන්නට සිංහල බෞද්ධ විඥානයක්, දර්ශනයක්, ප්‍රවාදයක් තිබී නැත. මෙත්තානන්ද මහතා ගුරු ජීවිතයේ මුල්කාලයේ ම එවකට ආනන්ද විදුහල වැනි බෞද්ධ විදුහල්වල ඉගැන්වූ බුදදහම විවේචනය කරමින් සරසවි සඳරැසට ලිපියක් ලියා ඇත. මෑත යුගයේ සිංහල බෞද්ධ නායකයන් අතරින් සිංහල බෞද්ධ දර්ශනයක් පදනම්කරගත් දේශපාලන විඥානයක් තිබුණේ ඒ මහතාට ය. මෙරට සංස්කෘතික වශයෙන් ක්‍රිස්තියානි රටක් බව ඒ මහතා අවබෝධකරගෙන තිබූ බව පැහැදිලි ය. ක්‍රිස්තියානි සංස්කෘතිය විසින් පුම්බනු ලැබූ කොලට් වැනි තුට්ටු දෙකේ කාටූන් චිත්‍ර ශිල්පීන් ලවා ඒ මහතාට දිගට හරහට පහරදෙනු ලැබුයේ ඒ නිසා ය.

බොහෝ සිංහල බෞද්ධයනට වූයේ දර්ශනයක් නොව සිද්ධි හා තත්ත්වය පදනම්කරගත් සන්දර්ශන දේශපාලනයක් ය. මෙත්තානන්ද මහතාට සිංහලය රාජ්‍ය භාෂාව බවට පත්කිරීම අධ්‍යාපනය හා සංස්කෘතිය පදනම්කරගත් අධිරාජ්‍ය විරෝධී ක්‍රියාවක් වුව ද අන් බොහෝ අයට ඒ සිංහලයන්ගේ තත්ත්වය ඉහළ දැමීම සඳහා කෙරෙන සිද්ධියක් විය. අධිපති සංස්කෘතිය ක්‍රිස්තියානි වූ ද සිංහල බෞද්ධකම ද සංකේතයක් වූ ද රටක සිංහල බෞද්ධයනට මොන තත්ත්වයක් ද? සිංහල බෞද්ධ දේශපාලනය අධිපති ක්‍රිස්තියානි සංස්කෘතියක ඡන්දය දිනාගැනීමට සිද්ධි සොයන, සුළු තත්ත්වයක් සඳහා, සංකේත වටා කෙරුණු දේශපාලනයක් විය. මෙත්තානන්ද මහතාගේ අදහස කුමක් වුව ද සිංහලය රාජ්‍ය භාෂාව කිරීම යනු අද සංකේතයක් පමණකි. අද අධ්‍යාපන මාධ්‍යය ඉංගිරිසි බවට පත්කිරීම සඳහා සිංහල බෞද්ධ විරෝධීන් හා එක් වී නායකත්වය ගන්නේ බෞද්ධ යැයි කියන පාසලක ආදි ශිෂ්‍යාවක වූ ලේකම්වරියක වීම පුදුමයක් නො වෙයි. සෝම හිමියන් වෙනුවෙන් සන්දර්ශන විරෝධීවීම තවත් සංකේතයක් හා සිද්ධියක් හඹායෑමක් වෙයි. මේ සංකේත දේශපාලනයෙන් බැටකා ඇත්තේත් බැටකන්නේත් සිංහල බෞද්ධයන් ය. අද ඉන්දියාව සිංහල බෞද්ධයන් දෙස බලන්නේ කරුණාවෙන් නො වෙයි. සිද්ධි හඹායන සංකේත අහුලන ව්‍යාජ දේශපාලනය නැවැත්විය යුතු ය. පසුගිය දා එක් ජනමාධ්‍යවේදියකු කීවේ මෙත්තානන්ද මහතා පණස්හයේ පියා බව ය. එහෙත් පණස්හයට බාප්පලා ද වූහ. බාප්පලාට තිබූ දර්ශනයක් විඥානයක් නැත. බාප්පලා එකතු වී පියා නැතිකළහ. බාප්පලාගේ සිද්ධි සංකේත තත්ත්ව හඹායන සන්දර්ශන දේශපාලනය උරුමකරගත්තන් දේශපාලනයෙහි නිරතවීමෙහි වන්දිය ගෙවීමට සිදුවී ඇත්තේ සිංහල බෞද්ධයනට ය.

© Prof. Nalin De Silva